# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1968/2 – 2016 මැයි 23 වැනි සඳුදා – 2016.05.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිකහ දකුණ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1163 තුම්මෝදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුම්මෝදර (අගපි 973) ගමේ පිහිටි, කුරුණෑගල දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක KU/KPW/2016/001 හා 2016.02.06 දින දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'A' සිට 'E' දක්වා පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 11.9519 ක් පමණ වූ ඉඩම් කොටස් සඳහා මායිම්:

01. කැබලි අක්ෂර '**A**' – **මහනුගලන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 3.6896**
උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ කේ. එම්. එස්. ජී. අභයවර්ධන සහ කේ. එම්. විජයවර්ධන හිමිකම් කියන කොස්ගහමුල කුඹුර; දකුණට: කේ. එම්. එස්. ජී. අභයවර්ධන සහ කේ. එම්. විජයවර්ධන හිමිකම් කියන කොස්ගහමුල කුඹුර සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර F සහ ඇළ.

02. කැබලි අක්ෂර '**B**' – **මහනුගලන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.9832**
උතුරට: කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ කේ. එම්. එස්. ජී. අභයවර්ධන හිමිකම් කියන කොස්ගහමුල කුඹුර; දකුණට: ඇළ; බටහිරට: ඇළ සහ කැබලි අක්ෂර F.

03. කැබලි අක්ෂර '**C**' – **මහනුගලන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3764**
උතුරට: කැබලි අක්ෂර D; නැගෙනහිරට: කැබලි අක්ෂර D, F සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්ද කුඹුර; දකුණට: මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්ද කුඹුර; බටහිරට: කැබලි අක්ෂර D.

04. කැබලි අක්ෂර '**D**' – **මහනුගලන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 6.8952**
උතුරට: ඩබ්ලිව්. එම්. එල්. ජේ. වීරසිංහ හිමිකම් කියන මහනුගලන්දවත්ත සී කොටස; නැගෙනහිරට: කැබලි අක්ෂර F, C, මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්ද කුඹුර සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්දවත්ත; දකුණට: මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්දවත්ත සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: කැබලි අක්ෂර H, මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්දවත්ත, කැබලි අක්ෂර G සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්දවත්ත.

05. කැබලි අක්ෂර '**E**' – **මහනුගලන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0075**
උතුරට: මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්දවත්ත සහ ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර H; දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: මහා භාරකාර දෙපාර්තමේන්තුව හිමිකම් කියන මහනුගලන්දවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/2/2015/BOI/308.
2016 අප්‍රේල් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 204



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුපලෙයි දකුණ J/257 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉරුපලෙයි ගමේ පිහිටි, යාපනය ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක Ya/KPY/2015/217 හා 2015.09.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.2339ක් පමණ වන කඩ්ඩුවාසල් සහ තලයඩි නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – කඩ්ඩුවාසල් සහ තලයඩි – ප්‍රමාණය: **හෙක්. 0.2339ක් පමණ**

උතුරට: මානික්කම් බාසුපදි සහ රාමලිංගම් සෙල්ලයියා හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: රාමලිංගම් සෙල්ලයියා සහ පොන්නයියා රත්නසභාපති හිමිකම් කියන ඉඩම; දකුණට: පොන්නයියා රත්නසභාපති හිමිකම් කියන ඉඩම සහ භාරතී පටුමග; බටහිරට: භාරතී පටුමග සහ මානික්කම් බාසුපදි හිමිකම් කියන ඉඩම.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/WS/93.
ප්‍රා.ලේ. යොමු අංකය: VE/DS/LLD/LA/IRUP/13.
2016 අප්‍රේල් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 205